97272

OL/2010/61-S-I-II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 S I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

| | | |
|---|---|---|
| භූගෝල විද්‍යාව | I, II | පැය තුනයි |
| புவியியல் | I, II | மூன்று மணித்தியாலம் |
| Geography | I, II | Three hours |

විභාග අංකය :..............................

## භූගෝල විද්‍යාව I

※ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.

※ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූල ව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

● අංක **1** සිට **10** තෙක් දී ඇති ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන තුළින් **තෝරා තිත්ඉර මත ලියන්න.**

1. පෘථිවිය මතුපිට සිට අභ්‍යන්තරයට යාමේ දී උෂ්ණත්වය ................................................
[ ක්‍රමයෙන් අඩු වේ. / ක්‍රමයෙන් වැඩි වේ. / ඒකාකාරව පවතී. ]

2. පෘථිවියේ භූ කාරක තැටි ව්‍යාප්තිය අනුව ශ්‍රී ලංකාව අයත් වන්නේ ............................................ භූ තැටියට ය.
[ ඉන්දු ඕස්ට්‍රේලියානු / යුරේසියානු / ඇන්ටාර්ක්ටික් ]

3. පෘථිවියේ ඇති විශාල කඳුවැටි නිර්මාණය වී ඇත්තේ ................................................ හටගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ය.
[ භූමිකම්පා / භූමිචලන / යමහල් ]

4. දකුණු ඇමරිකාවේ පිහිටි විශාලතම කඳුවැටිය ................................................ නම් වේ.
[ රොකී / ඇපලාචියන් / ඇන්ඩීස් ]

5. ආර්ජන්ටිනාවේ පිහිටි සෞම්‍ය කලාපික තෘණභූමි ................................................ නමින් හැඳින්වේ.
[ පැම්පාස් / ලානෝස් / කැම්පෝස් ]

6. ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාව යටතේ අනන්‍ය ආර්ථික කලාපයට අයත් මුහුදු ප්‍රදේශය වෙරළේ සිට නාවුක සැතපුම් ................................ දුරට විහිදේ.
[ 12 / 24 / 200 ]

7. ආදිවාසී ජන කොටසක් වූ 'පිග්මිවරුන්ගේ' නිජභූමිය ලෙස සැලකෙන්නේ ................................................ ප්‍රදේශයයි.
[ කොංගෝ වනාන්තර / ඇමේසන් වනාන්තර / සහරා කාන්තාර ]

8. ශ්‍රී ලංකාවේ ප්‍රධාන මාර්ග අතුරෙන් A-1 මාර්ගය ලෙස සැලකෙන්නේ කොළඹ සිට ................................................ දක්වා මාර්ගයයි.
[ හම්බන්තොට / රත්නපුරය / මහනුවර ]

9. ශ්‍රී ලංකාවේ ඊසාන දිග වෙරළේ 'පුල්මුඩෙයි' ප්‍රදේශයේ විශාල වශයෙන් ................................................ ඛනිජය තැන්පත් වී ඇති නිධියක් පිහිටා ඇත.
[ සිලිකාවැලි / ඉල්මනයිට් / මොනසයිට් ]

10. 1 : 50 000 භූ ලක්ෂණ සිතියමක දක්වෙන පරිමාණයට අනුව භූමියේ සැබෑ දුර කිලෝමීටර 1 ක්, සිතියමෙහි ............................ දක්වේ.
[ සෙන්ටිමීටර 1 කින් / සෙන්ටිමීටර 2 කින් / සෙන්ටිමීටර 4 කින් ]

[ දෙවැනි පිටුව බලන්න.

- අංක **11** සිට **20** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් 'නි' යන්න වටා ද වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.

11. පාෂාණ අධික පීඩනයට හා තාපයට භාජනය වීමෙන් එහි මූලික ස්වරූපය මුළුමනින් ම වෙනස් වී විපරිත පාෂාණ නිර්මාණය වේ. **නි / වැ**

12. වැව්, පොකුණු, ගංගා, විල් ආදියේ අන්තර්ගත ජලය භූතල ජලය ලෙස සැලකේ. **නි / වැ**

13. කුරුණෑගල දිස්ත්‍රික්කයේ කහටගහ සහ කොළොන්ගහ යන පතල්වලින් උසස් වර්ගයේ 'ඇපටයිට්' ඛනිජය ලබා ගැනේ. **නි / වැ**

14. දකුණු ආසියාවේ රටවල් අතුරෙන් මෝටර් රථ අපනයනයට එක් වූ අළුත් ම රට ශ්‍රී ලංකාවයි. **නි / වැ**

15. ලෝක ජන සංඛ්‍යාවෙන් 90% පමණ ප්‍රමාණයක් උතුරු අර්ධ ගෝලයේ රටවල ජීවත් වේ. **නි / වැ**

16. ඉන්දියාව මෝටර් රථ, යන්ත්‍රසූත්‍ර, පරිගණක, රෙදිපිළි, රසායන ද්‍රව්‍ය ආදිය නිෂ්පාදනය හා ආකර කර්මාන්තය අතින් ද වැදගත් ස්ථානයක් ගන්නා රටක් හෙයින් කාර්මික රටක් ලෙස සැලකේ. **නි / වැ**

17. රටක ජන සංඛ්‍යාවේ වර්ධන වේගය අඩු වන විට එම රටෙහි ජන සංඛ්‍යාව දෙගුණ වීමට ගතවන කාලය වැඩි වේ. **නි / වැ**

18. 1:50 000 භූ ලක්ෂණ සිතියම්වල භෞතික ලක්ෂණ නිරූපණය කරනු ලබන්නේ සමෝච්ච රේඛා මගිනි. **නි / වැ**

19. ලෝක වෙළෙඳාමේ වැඩි ම ප්‍රතිශතය හිමි කරගෙන ඇත්තේ අප්‍රිකානු රටවල් ය. **නි / වැ**

20. ලෝකයේ මධ්‍යධරණී දේශගුණය ව්‍යාප්ත වී ඇත්තේ මධ්‍යධරණී මුහුද අවට ප්‍රදේශවල පමණි. **නි / වැ**

- අංක **21** සිට **30** තෙක් ඇති ප්‍රශ්නවල **හිස්තැන්වලට** සුදුසු වචන යොද සම්පූර්ණ කරන්න.

21. ව්‍යුහය අනුව පෘථිවි කබොල සියල් හා ........................................... යන ස්තර දෙකකින් සමන්විත වේ.

22. උතුරු ඇමරිකාවේ සෞම්‍ය කලාපික තෘණ භූමි ........................................... නමින් හැඳින්වේ.

23. දකුණු, අග්නිදිග හා නැගෙනහිර ආසියාවේ වෙරළබඩ පහත්බිම් ප්‍රදේශවල සියුම් පාරිභෝගික කෘෂිකර්මය යටතේ වගා කෙරෙන ප්‍රධාන බෝගය ........................................... ය.

24. කුකුරුමාන්, කරඹ, පතොක් වැනි වෘක්ෂලතා බහුලව දක්නට ලැබෙන්නේ ශ්‍රී ලංකාවේ ........................................... දේශගුණික කලාපයට අයත් ප්‍රදේශවල ය.

25. ශ්‍රී ලංකාවේ ........................................... වගාව හා සම්බන්ධ පර්යේෂණායතනය තලවකැලේ පිහිටුවා ඇත.

26. 2001 ජන සංගණනය අනුව ........................................... දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ අඩුම ජන ඝනත්වය ඇති දිස්ත්‍රික්කය වේ.

27. ප්‍රවාහනය, වෙළෙඳාම, සංචාරක ව්‍යාපාරය ආදිය ........................................... කර්මාන්ත ගණයට අයත් වේ.

28. යුරෝපා රටවල වයස්ගතවූවන්ගේ ප්‍රතිශතය ආසියාතික රටවලට වඩා ........................................... අගයක් ගනී.

29. පැසිෆික් සාගරය ........................................... ඇළ මාර්ගය මගින් අත්ලාන්තික් සාගරය හා සම්බන්ධ වේ.

30. ඕස්ට්‍රේලියාවේ වයඹ දිග වෙරළ ප්‍රදේශයේ හටගන්නා සුළි සුළං ........................................... නමින් හැඳින්වේ.

[ තුන්වැනි පිටුව බලන්න.

- අංක **31** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

31. A - පෘථිවි වායුගෝලය එකම වායු වර්ගයකින් සමන්විත වේ.
B - වායු ගෝලයේ ඉහළ කොටස්වලට වඩා පහළ කොටස්වල වැඩි පීඩනයක් ඇත.
C - වායු ගෝලයේ පහළ ම ස්ථරය අපරිවර්තී ගෝලය නමින් හැඳින්වේ.
D - වායුගෝලයේ අඩංගු ජලවාෂ්ප ප්‍රමාණය තැනින් තැනට හා කලින් කලට වෙනස් වේ.
E - පෘථිවි පෘෂ්ඨයේ සිට මීටර 10000ක් පමණ ඉහළට යන තෙක් සෑම මීටර 100කට ම 0.64 °C බැගින් උෂ්ණත්වය වැඩි වේ.
ඉහත A, B, C, D හා E යන ප්‍රකාශ අතුරෙන් පෘථිවි වායු ගෝලයේ සංයුතිය හා ව්‍යුහය පිළිබඳ නිවැරදි ප්‍රකාශ දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා B (2) B හා D (3) C හා D (4) C හා E (.........)

32. ගෝලීය ජල ව්‍යාප්තිය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) පෘථිවිතලයෙන් 97% ක් ම වැසී ඇත්තේ ජලයෙනි.
(2) ජලගෝලයේ අඩංගු ජලය ඝන, ද්‍රව හා වායු යන ස්වභාවයන් තුනෙන් ම පවතී.
(3) ඇළ, දොළ, ගංගා හා විල්වල ඇති ජලය භූගත ජලය ලෙස හැඳින්වේ.
(4) ප්‍රධාන සාගරවල ව්‍යාප්තිය අනුව කුඩා ම සාගරය අත්ලාන්තික් සාගරයයි. (.........)

33. A - 27°C ට ආසන්න ඒකාකාරී මාධ්‍ය උෂ්ණත්වය
B - 2000 mm ට වැඩි වාර්ෂික වර්ෂාපතනය
C - 30 m - 300 m අතර උස් බිම් (ජලය බැසයන මඳ බෑවුම් සහිත)
D - කබොක් පස
ඉහත භෞතික සාධක වඩාත් උචිත වන ව්‍යාපාරික බෝගය කුමක් ද?
(1) තේ (2) රබර් (3) පොල් (4) කුරුඳු (.........)


34. විශ්ව විද්‍යාල හා සම්බන්ධ පර්යේෂණායතන ආශ්‍රිතව ස්ථානගත වීම පහත සඳහන් කවර කර්මාන්තයක් හා සම්බන්ධ විශේෂ ලක්ෂණයක් ද?
(1) මෝටර් රථ (2) රෙදිපිළි (3) විද්‍යුත් (4) සංචාරක (.........)

35. ශ්‍රී ලංකාවේ වියළි කලාපයට අයත් වව්නියාව, හම්බන්තොට, අනුරාධපුර, පොළොන්නරුව හා මොනරාගල වැනි දිස්ත්‍රික්කවල බහුලව දක්නට ලැබෙන පස් වර්ගය කුමක් ද?
(1) රතු දුඹුරු පස (2) රතු දුඹුරු ලැටසෝල් පස
(3) දියළු පස (4) රතු කහ ලැටසෝල් පස (.........)

36. ජාත්‍යන්තර වෙළෙඳාම කෙරෙහි වඩාත් අහිතකර ලෙස බලපෑමක් ඇති කරන සාධකය මින් කවරක් ද?
(1) විද්‍යුත් මාධ්‍ය මගින් මුදල් හුවමාරුව
(2) සංවර්ධිත රටවල් වැඩි වශයෙන් කාර්මික නිමි ද්‍රව්‍ය අපනයනය කිරීම
(3) ගබඩා කිරීම්වලින් තොරව කර්මාන්ත ශාලාවෙන් සෘජුව පාරිභෝගිකයා වෙත භාණ්ඩ සැපයීම
(4) බහු ජාතික සමාගම්වල ඒකාධිකාරය (.........)

37. දකුණු ආසියාවේ රටවල් අතුරෙන් බහුලව ජල ගැලීම්වලට ගොදුරුවන රට ලෙස සැලකෙන්නේ
(1) ශ්‍රී ලංකාවයි. (2) ඉන්දියාවයි. (3) පකිස්තානයයි. (4) බංගලාදේශයයි. (.........)

- අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දක්වෙන රූප සටහන් උපයෝගී කර ගන්න.




1 රූපය 2 රූපය 3 රූපය

38. අංක 1 දරන රූප සටහනේ *A-B* රේඛාවෙන් දක්වෙන්නේ
(1) නෙරුවකි. (2) නිම්නයකි. (3) කඳු වැටියකි. (4) දිය බෙත්මකි. (.........)

39. අංක 2 දරන රූප සටහනේ *C-D* රේඛාවෙන් දක්වෙන්නේ
(1) අවතල බෑවුමකි. (2) උත්තල බෑවුමකි. (3) මොහොර බෑවුමකි. (4) දළ බෑවුමකි. (.........)

40. අංක 3 දරන රූප සටහනේ ඇති කොන්කන්ද මුදුනේ ත්‍රිකෝණමිතික ස්ථානයකි. එහි උස විය හැක්කේ පහත සඳහන් කවරක් ද?
(1) මීටර 587 (2) මීටර 595 (3) මීටර 611 (4) මීටර 703 (.........)

* *

[ හතරවැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 S I,II

97227

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

## භූගෝල විද්‍යාව II

※ මෙම ප්‍රශ්න පත්‍රය I, II, III වශයෙන් කොටස් තුනකින් සමන්විත ය.
※ I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි 'අ', 'ආ' සහ 'ඉ' කොටස් **තුනටම** පිළිතුරු සැපයිය යුතු ය.
※ II කොටසින් ප්‍රශ්න **දෙකකටත්** III කොටසින් ප්‍රශ්න **දෙකකටත්** පිළිතුරු සැපයිය යුතු ය.
※ පිළිතුරු දිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

### I කොටස

1. (අ) ඔබ වෙත සපයා ඇති 1:50 000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කොට, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක 08) යොදා ගන්න.

(i) සිතියම් ප්‍රදේශයේ හෙල් වැටි විහිදෙන දිශාව කුමක් දැ'යි වරහන් තුළ දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා ලියන්න. (උතුරු-දකුණු / නැගෙනහිර-බටහිර / වයඹ-ගිනිකොණ) *(ලකුණු 01 යි.)*

(ii) ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන් ව්‍යාප්ත වී ඇති වාණිජ බෝගය කුමක් ද? *(ලකුණු 01 යි.)*

(iii) සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන ජලවහන රටාව කුමක් දැ'යි වරහන් තුළ දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා ලියන්න. (ශාඛීය / අරීය / ජාලාකාර) *(ලකුණු 01 යි.)*

(iv) සිතියම් ප්‍රදේශය ශ්‍රී ලංකාවේ කවර දේශගුණික කලාපයකට අයත් විය හැකි ද? *(ලකුණු 01 යි.)*

(v) සිතියමේ P, Q හා R යන අක්ෂරවලින් දක්වා රවුම් කර ඇති ස්ථාන අතුරෙන් රූපවාහිනී සම්ප්‍රේෂණ කුලුනක් පිහිටුවීමට වඩාත් සුදුසු ස්ථානය කුමක් ද? *(ලකුණු 01 යි.)*

(vi) සිතියමේ X ස්ථානයේ සිට Y ස්ථානය දක්වා උතුරට විහිදෙන ප්‍රධාන මාර්ගයේ දිග කිලෝමීටර කීය ද? *(ලකුණු 01 යි.)*

(vii) සිතියම් ප්‍රදේශය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් A, B, C හා D වලින් දක්වා ඇත. ඒ එක් එක් ප්‍රකාශය කියවා බලා නිවැරදි නම් **"නි"** යන්න ද වැරදි නම් **"වැ"** යන්න ද පිළිතුරු පත්‍රයේ ඊට නියමිත ස්ථානයේ ලියා දක්වන්න.

A - සිතියම් ප්‍රදේශය ශ්‍රී ලංකාවේ පළාත් දෙකකට අයත් වේ. *(ලකුණු 01 යි.)*
B - ප්‍රදේශයේ වී වගාව කෙරෙන්නේ වාරිමාර්ග ජල සම්පාදනය මගිනි. *(ලකුණු 01 යි.)*
C - ප්‍රදේශයේ පරිපාලන මායිම් නිශ්චය කිරීමේ දී ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ ගංගා හා අතු ගංගාවල විහිදීමයි. *(ලකුණු 01 යි.)*
D - ප්‍රදේශයේ වාසය කරන ජනතාව අතර ආගමික විවිධත්වයක් දක්නට නොලැබේ. *(ලකුණු 01 යි.)*

(ආ) නිවැරදි සිතියම් විද්‍යාත්මක ශිල්පීය ක්‍රම භාවිත කොට, පහත අංක (i) සිට (v) දක්වා දී ඇති දෑ, සපයා ඇති ලෝක සිතියමෙහි (පිටු අංක 09) ලකුණු කර, නම් කරන්න.

(i) පිරනීස් / ඇල්ප්ස් / කාර්පේතියන් යන කඳුවැටි අතුරෙන් ප්‍රංශය හා ස්පාඤ්ඤය වෙන් කෙරෙන සීමාව ලෙස සැලකිය හැකි කඳුවැටිය ලකුණු කර, එහි නම ලියන්න.

(ii) ඩැනියුබ් / යූරල් / යුප්‍රටීස් ටයිග්‍රීස් යන ගංගා අතුරෙන් කැස්පියන් මුහුදට ගලා බසින ගංගාව ලකුණු කර, එහි නම ලියන්න.

(iii) වික්ටෝරියා / ග්‍රේට්බෙයාර් / අයර් යන විල් අතුරෙන් ඕස්ට්‍රේලියාවේ පිහිටි විල ලකුණු කර, එහි නම ලියන්න.

(iv) මාලදිවයින් / අන්දමන් දූපත් / ලක්ෂද්වීප යන දූපත් අතුරෙන් අනාගතයේ දී සාගර ජල මට්ටම් ඉහළ යාම නිසා සාගරයෙන් යටවීමේ තර්ජනයට මුහුණ පා ඇති දූපත් සමූහය ලකුණු කර, එහි නම ලියන්න.

(v) කොළඹ සිට සිංගප්පූරුව හා හොංකොං යන වරාය හරහා ටෝකියෝ දක්වා නැව් මාර්ගය ලකුණු කර, නම් කරන්න. *(ලකුණු 05 යි.)*

[ පස්වැනි පිටුව බලන්න.

(ඉ) නිවැරදි සිතියම් විද්‍යාත්මක ශිල්පීය ක්‍රම භාවිත කොට, පහත අංක **(i)** සිට **(v)** දක්වා දී ඇති දෑ, සපයා ඇති ශ්‍රී ලංකාවේ ආකෘති සිතියමෙහි (පිටු අංක 09) ලකුණු කර, නම් කරන්න.

(i) සංචාරකයින් බහුල ලෙස ඇදී එන නිරිතදිග මුහුදු තීරයේ කොරල් පර පිහිටි ස්ථානය

(ii) ශ්‍රී ලංකාවේ දෙවන අන්තර් ජාතික ගුවන් තොටුපළ ඉදිකෙරෙන ස්ථානය

(iii) වයඹ දිග වෙරළේ පිහිටි ශ්‍රී ලංකාවට අයත් විශාලතම දූපත

(iv) විදුලි බලාගාර සඳහා ජලය සපයන කාසල්රි හා මාඋස්සාකැලේ යන ජලාශ හා සම්බන්ධ වන ප්‍රධාන ගංගාව (මෙය බටහිර වෙරළට ගලා බසී.)

(v) වීදුරු නිෂ්පාදනය සඳහා භාවිත කෙරෙන සිලිකා වැලි බහුලව තිධිගතවී ඇති ශ්‍රී ලංකාවේ බටහිර වෙරළට ආසන්නව පිහිටි ස්ථානය *(ලකුණු 05 යි.)*

## II කොටස

**2.** කලින් කල විවිධ වෙනස්කම්වලට භාජනය වෙමින් වර්තමානයේ ඉතා සංකීර්ණ මිනිස් කටයුත්තක් බවට කෘෂිකර්මය පත්ව ඇත. පහත දක්වෙන්නේ ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග යටතේ කෙරෙන කටයුතු කිහිපයකි.
[තිරිඟු වගාව / පලතුරු වගාව / වී වගාව / රබර් වගාව / කිරි නිෂ්පාදනය]

(i) ඉහත කෘෂිකාර්මික කටයුතු අතුරෙන්

(a) විස්තෘත වාණිජ කෘෂිකර්මය යටතේ කෙරෙන බෝග වගාව ද

(b) සියුම් පාරිභෝගික කෘෂිකර්මය යටතේ කෙරෙන බෝග වගාව ද (a), (b) අනුපිළිවෙළින් සඳහන් කරන්න. *(ලකුණු 02 යි.)*


(ii) (a) කිරි නිෂ්පාදනය අයත් වන කෘෂිකාර්මික භූමි පාරිභෝග වර්ගය කුමක් ද'යි නම් කරන්න.

(b) කිරි හා කිරිද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන හැරුණු විට එම භූමි පාරිභෝග වර්ගය යටතේ කෙරෙන වෙනත් ආර්ථික කටයුතු **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි.)*

(iii) (a) රබර් වගාව සඳහා ප්‍රසිද්ධ රටවල් **දෙකක්** (ශ්‍රී ලංකාව හැර) නම් කරන්න.

(b) ලෝකයේ රබර් වගා කරන රටවල් එම වගාව හා නිෂ්පාදනය සම්බන්ධයෙන් මුහුණ පා ඇති ගැටලු **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 05 යි.)*

- අංක **3** සහ **4** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දක්වෙන ලෝක සිතියම භාවිත කරන්න.




**3.** මානව ශිෂ්ටාචාරයේ ඈත අවධිවල සිට ම ආරම්භ වී ලොව ප්‍රචලිත වූ කර්මාන්ත දෙකක් ලෙස රෙදිපිළි සහ යකඩ හා වානේ මුල් තැනක් ගනී.

(i) ලෝකයේ කපු පිළි නිෂ්පාදනයට වැදගත් වූ රටවල් දෙකක් ඉහත ලෝක සිතියමේ *A* හා *B* අක්ෂරවලින් දක්වා ඇත. එම රටවල් **දෙක** මොනවා ද'යි පිළිවෙළින් නම් කරන්න. *(ලකුණු 02 යි.)*

(ii) (a) ලෝකයේ කපු පිළි කර්මාන්තය ආශ්‍රිත නව ප්‍රවණතා **දෙකක්** ද

(b) කපු පිළි කර්මාන්තය මුහුණපාන ගැටලුවක් ද සඳහන් කරන්න. *(ලකුණු 03 යි.)*

(iii) (a) සිතියමෙහි *C* හා *D* අක්ෂරවලින් දක්වා ඇති යකඩ හා වානේ කර්මාන්තයට ප්‍රසිද්ධ රටවල් **දෙක** පිළිවෙළින් නම් කරන්න.

(b) ජපානයේ යකඩ හා වානේ කර්මාන්තය සම්බන්ධ විශේෂ ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 05 යි.)*

[ හයවැනි පිටුව බලන්න.

4. මෑත කාලයේ දී ලොව විවිධ ප්‍රදේශවලින් ජලගැලීම්, ගිනිකඳු පිපිරීම්, භූමිකම්පා වැනි ස්වාභාවික ආපදා නිතර අසන්නට ලැබුණි.

(i) (a) ඉහත සිතියමේ අංක ① න් දක්වෙන්නේ මෑතක දී ගිනිකඳු පිපිරීමක් නිසා මහත් විනාශයක් සිදු වූ රටකි. එම රටෙහි නම කුමක් ද?

(b) සිතියමෙහි තිත් ඉරිවලින් වටකොට අංක ② න් දක්වෙන්නේ භූමි කම්පා නිසා විශාල ලෙස හානි සිදු වූ රටකි. එම රටෙහි නම කුමක් ද? *(ලකුණු 02 යි.)*

(ii) ගිනිකඳු පිපිරීම් (යමහල් ක්‍රියාකාරිත්වය) නිසා සිදුවන මිනිස් ජීවිත හා දේපල විනාශය හැරුණු විට පරිසරයට සිදුවන අහිතකර බලපෑම් **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි.)*

(iii) (a) සිතියමෙහි අංක ③ න් දක්වෙන්නේ මෑතදී ජල ගැලීම් නිසා හානි සිදු වූ රටකි. එහි නම කුමක් ද?

(b) ජල ගැලීම් ඇතිවීමට බලපාන හේතු **දෙකක්** සඳහන් කොට, ජල ගැලීම්වලින් සිදු වන හානි අවම කිරීමට ගත හැකි පියවර **දෙකක්** විස්තර කරන්න. *(ලකුණු 05 යි.)*

5. ලෝකයේ ස්වාභාවික සම්පත් අතුරෙන් බලශක්තිය නිපදවීම සඳහා භාවිත කෙරෙන ඛනිජ සම්පත් මෙන්ම මිනිසාගේ විවිධ අවශ්‍යතා සපයා ගැනීමට ඉවහල් වන සම්පත් ද ක්ෂය වී යාමේ තර්ජනයට මුහුණ පා ඇත.

(i) බලශක්තිය නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගන්නා ගල්අඟුරු නිෂ්පාදනයට වැදගත් වන, යුරෝපයේ රටක් ද ඛනිජ තෙල් නිෂ්පාදනයට වැදගත් වන, මැද පෙරදිග රටක් ද නම් කරන්න. *(ලකුණු 02 යි.)*


(ii) ගල් අඟුරු හා ඛනිජ තෙල් වෙනුවට වෙනත් විකල්ප බලශක්ති සෙවීම කෙරෙහි වර්තමානයේ විද්‍යාඥයන්ගේ විශේෂ අවධානය යොමු වී ඇත. ඊට බලපා ඇති හේතු **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි.)*

(iii) (a) ස්වාභාවික සම්පතක් වූ වනාන්තර විනාශවීම නිසා ලෝකයට අත්විය හැකි අහිතකර ප්‍රතිඵල **තුනක්** සඳහන් කරන්න.

(b) වනාන්තර සංරක්ෂණයට ගත හැකි පියවර **දෙකක්** විස්තර කරන්න. *(ලකුණු 05 යි.)*

## III කොටස

6. විශාල සාගර කලාපයකින් වටවී පිහිටීම නිසා ශ්‍රී ලංකාවට වාසි රැසක් අත්ව තිබේ.




(i) (a) ශ්‍රී ලංකාවට අයත් මුහුදු ප්‍රදේශය කලාප තුනකට බෙදා ඇත. ඉන් එක් කලාපයක් ඉහත සිතියමෙහි අංක ① න් දක්වේ. එය හැඳින්වෙන්නේ කවර නමකින් ද?


(b) සිතියමෙහි අංක ② න් දක්වා ඇති භූ විෂමතා කලාපය හැඳින්වෙන නම කුමක් ද? *(ලකුණු 02 යි.)*

(ii) සිතියමේ අංක ② කලාපයෙහි දක්නට ලැබෙන භූ ලක්ෂණ **තුනක්** නිදසුන් දක්වමින් විස්තර කරන්න. *(ලකුණු 03 යි.)*

(iii) අංක ② කලාපයේ භෞතික ලක්ෂණ මිනිස් කටයුතු සඳහා වැදගත් වන ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි.)*

[ හත්වැනි පිටුව බලන්න.

- අංක 7 සහ 8 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ශ්‍රී ලංකා සිතියම භාවිත කරන්න.




**7.** ප්‍රධාන වාණිජ බෝග වූ තේ, රබර් හා පොල් හැරුණු විට සුළු අපනයන බෝග හා සත්ත්ව පාලනය ද ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි වැදගත් තැනක් ගනී.

(i) යාබදව දැක්වෙන සිතියමෙහි Ⓐ අක්ෂරයෙන් දක්වා ඇති, රබර් වගාවට වැදගත් වන දිස්ත්‍රික්කයෙහි නමත් Ⓑ අක්ෂරයෙන් දක්වා ඇති තේ වගා කරන දිස්ත්‍රික්කයෙහි නමත් අනුපිළිවෙළින් සඳහන් කරන්න. *(ලකුණු 02 යි.)*

(ii) (a) සිතියමේ Ⓒ අක්ෂරයෙන් දැක්වෙන සුළු අපනයන බෝග වගාවට වැදගත් වන දිස්ත්‍රික්කයෙහි නම කුමක් ද?

(b) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු අතුරෙන් සුළු අපනයන බෝග වගාව වැදගත් වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි.)*

(iii) (a) සිතියමේ Ⓓ අක්ෂරයෙන් දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ කුකුළු පාලන බිම් තීරුවට අයත් වන දිස්ත්‍රික්කයකි. එහි නම කුමක් ද?

(b) සත්ත්ව පාලනය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට වැදගත් වන ආකාරය කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි.)*

**8.** යාබදව දක්වෙන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව ජන ඝනත්ව සිතියමෙහි වැඩි ම ජන ඝනත්වය ඇති දිස්ත්‍රික්කයේ සිට අඩු ම ජන ඝනත්වය ඇති දිස්ත්‍රික්කය දක්වා අංක 1 සිට 25 තෙක් අනුපිළිවෙළින් අංක යොදා ඇත. ඒ අනුව

(i) වැඩිම ජන ඝනත්වය ඇති දිස්ත්‍රික්කයේ නමත් අඩුම ජන ඝනත්වය ඇති දිස්ත්‍රික්කයේ නමත් පිළිවෙළින් සඳහන් කරන්න. *(ලකුණු 02 යි.)*

(ii) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යාප්තියෙහි අසමාන බවක් දක්නට ඇත. ඊට හේතු **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි.)*

(iii) පහත සඳහන් එක් එක් කරුණ යටතේ ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවෙහි මෑත කාලීනව දක්නට ලැබෙන ප්‍රවණතා **එක** බැගින් දක්වන්න.

A - ආයු අපේක්ෂාව

B - පුම්තිරි අනුපාතය

C - ජන සංඛ්‍යා වර්ධන වේගය

D - බාලවයස් යැපෙන්නන් සංඛ්‍යාව

E - වයස්ගතවූවන්ගේ සංඛ්‍යාව *(ලකුණු 05 යි.)*

**9.** ගොඩබිම, ගුවන් හා නාවික ප්‍රවාහන සේවාවන්ගේ දියුණුව ශ්‍රී ලංකාවේ සංවර්ධනය වේගවත් කිරීමෙහිලා වැදගත් සාධකයක් වේ.

(i) ශ්‍රී ලංකාවේ මහා මාර්ග සංවර්ධනය සඳහා වර්තමානයේ ගෙන ඇති පියවර **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 02 යි.)*

(ii) (a) යාපන අර්ධද්වීපයේ ගුවන් තොටුපළ පිහිටා ඇති ස්ථානය කුමක් ද?

(b) අන්තර්ජාතික ගුවන් ප්‍රවාහන කටයුතු දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය වර්තමානයේ ගෙන ඇති පියවර **දෙකක්** විස්තර කරන්න. *(ලකුණු 03 යි.)*

(iii) ශ්‍රී ලංකාවේ නාවික ප්‍රවාහනයේ යෝධ පියවරක් ලෙස සැලකෙන හම්බන්තොට වරාය ඉදිකිරීම සමස්ත ශ්‍රී ලංකාවේ ම සංවර්ධනයට දායක වන ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි.)*

* * *

[ අටවැනි පිටුව බලන්න.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/இலங்கைப் பரீட்சைத் திணைக்களம்/Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர(சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

විභාග අංකය / சுட்டெண் / Index Number } ........................................

97280

(61) භූගෝල විද්‍යාව II
புவியியல் II
**Geography II**

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. / பரீட்சகரின் உபயோகத் துக்கு மட்டும் / For Examiner's Use Only

**1.** (අ) /(அ)/ (a)

(i) ........................................................................................

(ii) ........................................................................................

(iii) ........................................................................................

(iv) ........................................................................................

(v) ........................................................................................

(vi) ........................................................................................

(vii) A. ........................................................................................


B. ........................................................................................

C. ........................................................................................


D. ........................................................................................

10

(ආ) /(ஆ) / (b)




(ඇ) /(இ) / (c)




1. (අ) (அ) (a) $\overline{10}$ (ආ) (ஆ) (b) $\overline{5}$ (ඇ) (இ) (c) $\overline{5}$ = $\overline{20}$

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2010**

# භූගෝල විද්‍යාව II
# புவியியல் II
# Geography II




Scale : 1:50 000